## 118 – මල් සුවඳේ

මල් සුවඳේ නැගලා
එම් මම ඔබව සොයා
තරු වැල් බැඳ ගෙන
ඉර හඳ ඇඳ ගෙන
බබලා ඔබව සොයා

මී දුම හා මුසුවී
එම් මම ඔබව සොයා
එතුම් වදයේ – පැණිගෙන උදයේ
එම් මම ඔබව සොයා

කුරුළුන් කැදැලි සොයා
ඉර නැති සැන්දෑවේ
යනසේ එම් ඔබ – එම් මම යම් ඔබ
හිමි පා ඔබව සොයා

මගේ මල් දිවිය නෙලා
මසුරන් බඳුනක ලා
සුවඳ ලාටු හා පරාග එහිලා
ගෙන එම් ඔබව සොයා